16 වන පිටෙන්

"මම ළමයින්ට කැමති නැහැ'' ලිහිණියා පිළිතුරු දුන්නා. "පහුගිය ගිම්හාන කාලේ මම ගඟබඩ වාසය කරද්දී අර තිරිඟු මෝල හිමියාගේ මහා අණක් ගුණක් නැති කොල්ලෝ දෙන්නා මට නිතරම ගල් වලින් ගැසුවා. අපි ලිහිණියෝ බොහොම වේගයෙන් පියාඹන අය නිසා උන්ට කවදාවත් මට වදින්න නම් ගල් පාරවල් ගහන්න බැරි වුණා. ඒ නැතත් අපේ පවුලේ හැමදෙනාම කඩිසර බවට හරි ප්‍රසිද්ධයි. ඒත් මම නම් සලකන්නේ ඒ වැඩේ අපට කළ අගෞරවයක් හැටියට.''

ඒත් ප්‍රීතිමත් කුමාරයාගේ දුක්බර පෙනුම දැකලා පුංචි ලිහිණියා ට අනුකම්පා හිතුණා. "මෙතැන හරිම සීතලයි'' ඔහු කීවා. "ඒත් මම තව එක රැයක් ඔබ එක්ක ඉඳලා ඔබේ පණිවිඩකරුවා වෙන්නම්''

"ඔබට බොහොමත්ම ස්තූතියි පුංචි ලිහිණියෝ'' කුමාරයා කීවා.

ඉතින් ලිහිණියා කුමාරයාගේ කඩුවෙන් රත් මැණික ගලවාගෙන, එය හොටයේ තබාගෙන නගරයේ පියැසි වලට ඉහළින් පියාසර කළා. ඔහු සුදු පැහැති කිරිගරුඬ දේවදූතයන් අඹා තිබුණු පල්ලියේ උස් කුලුන පසු කළා. ඔහු රජ මාලිගය පසු කරද්දී නැටුමක හඬ ඇසුණා. ලස්සන කෙල්ලක් තම පෙම්වතා සමඟ සඳලුතලයට පැමිණියා. "අහසේ තරු කොයිතරම් අලංකාරද'' ඔහු ඈට කීවා. "ආදරයේ බලය කොයිතරම් අපූරු ද?''

"හෙට රාජකීය නැටුමට අඳින්න මගේ ගවුම ලෑස්ති ඇති කියලා මම ප්‍රාර්ථනා කරනවා'' ඈ පිළිතුරු දුන්නා. "මම අණ කළා ගවුමේ විසිතුරු මල් මහන්න කියලා, ඒත් ඇඳුම් මහන්නියන් හරිම කම්මැලියි''

ඔහු ගඟට ඉහළින් පියාසර කරද්දී නැව්වල කුඹගස්වල එල්ලෙන ලන්තෑරුම් දුටුවා. යුදෙව් ජනාවාස පසු කරද්දී වයසක යුදෙව්වන් එකිනෙකා හා හෙට්ටු කරමින්, තඹ තරාදි වල සල්ලි කිරමින් සිටිනු දුටුවා. අන්තිමේදී ඔහු දුප්පත් නිවසට ළඟා වී ඇතුළට එබී බැලුවා. කුඩා දරුවා උණ විකාරයෙන් ඇඳේ ඒ මේ අත පෙරළෙමින් සිටියා, ඔහුගේ අම්මා මහන්සිය නිසා නින්දට වැටී සිටියා. ඔහු ගේ තුළට ගොස් මේසය මත තිබුණු ඇගේ දිදාලය අසලින් විශාල රත් මැණික තැබුවා. ඉන්පසු ඔහු ඇඳ වටා ඉතා මුදු ලෙස පියාඹා ඔහුගේ පියාපතින් දරුවාට පවන් සැලුවා. "මට හරිම සිසිලක් දැනෙනවා.'' දරුවා කීවා. "මට සනීප වෙනවා වෙන්න ඇති''; එසේ කියා ඔහු සැප නින්දකට වැටුණා.

ලිහිණියා සතුටු කුමාරයා වෙත පියාඹා ගොසින් ඔහු කළ දේ ගැන විස්තර කීවා. "හරි පුදුමයි'' ඔහු කීවා, "වටපිට සීතල වුණත් මට දැන් හරි උණුසුමක් දැනෙනවා.''

"ඒ ඔබ යහපත් දෙයක් කළ නිසා.'' කුමාරයා කීවා. පුංචි ලිහිණියා මේ ගැන කල්පනා කරමින් නින්දට වැටුණා. කල්පනා කිරීම ඔහුට නිතරම නිදිමත ගෙනාවා.

පසුදින උදා වුණු පසු ඔහු ගංගාවට ගොස් දිය නාගත්තා. "හරිම විශ්මිත සංසිද්ධියක්'' පාලම උඩින් ගමන් කරමින් සිටි පක්ෂි විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙක් මෙය දැක පුදුම වුණා. "සීත කාලයේ ලිහිණියෙක්!'' ඉනික්බිති ඔහු ප්‍රාදේශීය පුවත්පතට ඒ ගැන දීර්ඝ ලිපියක් ලීවා. එය කාටවත් නොතේරෙන වචන වලින් පිරී තිබුණත් බොහෝ දෙනා එහි වැකි උපුටා දැක්වූවා.

"අද රෑට මම ඊජිප්තුව බලා යනවා,'' කී ලිහිණියා ඒ ගැන සිතමින් සතුටින් පසු වූවා. ඔහු නගරයේ හැම පොදු ස්මාරකයක් වෙතම ගිය අතර පල්ලියේ කුලුන මත බොහෝ වෙලාවක් ගත කළා. ඔහු යන යන තැන උන් ගේ කුරුල්ලන් ඔහුව දැක "කොයිතරම් වැදගත් අමුත්තෙක්ද!'' කියා එකිනෙකාට මුමුනනු ඔහු ඉතා ආශාවෙන් අසා සිටියා.

සඳ නැඟ ආ විට ඔහු නැවතත් ප්‍රීතිමත් කුමාරයා වෙත ගියා. "ඔබට ඊජිප්තුව වෙත ගෙනයන්නට දෙයක් තිබේ ද?'' ඔහු ඇසුවා. "මම මේ පිටත්වෙන්න සූදානම් වෙන්නේ''

"ලිහිණියෝ, ලිහිණියෝ, පුංචි ලිහිණියෝ'' කුමාරයා කීවා. "ඔබට බැරිද මාත් එක්ක තව එක රැයක් ගතකරන්න?''

"මා එනතුරු අනිත් අය ඊජිප්තුවේ බලාගෙන ඇති'' ලිහිණියා පිළිතුරු දුන්නා. "හෙට මගේ මිතුරන් දෙවෙනි ඇළ මාර්ගය වෙත පියාසර කරනු ඇති. ඒ අවට පන් ගාල් වල දිය අශ්වයෝ වැතිරිලා ඇති. කළුගලින් තැනුණු සිංහාසනයක මෙම්නොන් දෙවියන් හිඳගෙන ඇති. ඔහු මුලු රෑ පුරාම තරු දිහා බලාගත්වනම හිඳ, උදා තරුව දිලිසේද්දී එක් වරක් පමණක් සතුටින් කෑගසා ඉනික්බිති නිහඬ වෙනවා. මධ්‍යහ්නයෙදී කහ පැහැති සිංහයන් දිය බීමට ඉවුර වෙත එනවා. උන්ගේ ඇස් කොළ මැණික් වගෙයි, උන්ගේ ගර්ජනයට ඇළේ ශබ්දයත් පරාදයි.''

"ලිහිණියෝ, ලිහිණියෝ, පුංචි ලිහිණියෝ'' කුමාරයා කීවා. "දුර ඈත නගරයෙන් අනෙත් පස සොල්දර කාමරයක මට තරුණයෙක් පෙනෙනවා. ඔහු කඩදාසි පිරුණු මේසයක් මතට නැඹුරු වී සිටින්නේ. ඔහු සිටිනා තැනට කිට්ටුවෙන් වීදුරුවක දැමූ පරවුණු වයලට් මල් පොකුරක් තිබෙනවා. ඔහුට ඇත්තේ දුඹුරු පැහැ බොකුටු කෙහෙ රැළි, ඔහුගේ දෙතොල දෙළුම් මෙන් රත් පැහැතියි. ඔහුට තිබෙන්නේ හීන වලින් මත් වුණු විශාල දෑසක්. වේදිකාවේ අධ්‍යක්ෂවරයා වෙනුවෙන් නාට්‍යයක් ලියා ඉවරකරන්නට ඔහු උත්සාහ කරමිනුයි සිටින්නේ. එහෙත් අධික සීතල නිසා ඔහුට තවදුරටත් ලියන්නට බැහැ. උදුනේ ගින්දර නැහැ, කුසගින්න නිසා ඔහු ක්ලාන්තයෙන්.''

"මම ඔබත් එක්ක තව දවසක් ඉන්නම්'' ඇත්තටම හොඳ හදවතක් තිබුණු ලිහිණියා පිළිතුරු දුන්නා. "මම ඔහුට තවත් රත් මැණිකක් ගිහින් දෙන්නද?''

"අහෝ! දැන් තව රත් මැණික් නම් ඉතිරිවෙලා නැහැ,'' කුමාරයා කීවා; "මට ඉතිරිවෙලා තියෙන්නේ මගේ දෑස විතරයි. ඒවා සකසා තිබෙන්නේ අවුරුදු දහස් ගණනකට කලින් ඉන්දියාවෙන් ගෙනා දුර්ලභ නිල් මැණික් වලින්. ඉන් එකක් උගුල්ලාගෙන ගොස් ඔහුට දෙන්න. ඔහු එය ආභරණකරුට විකුණා කෑමත්, දරත් මිලදී ගනීවි. ඊටපස්සේ ඔහුගේ නාට්‍යය ලියා ඉවර කරාවි.''

"ආදර කුමාරයෝ'' ලිහිණියා කීවා, "මට ඒක නම් කරන්න බැහැ''; එසේ කියා ඔහු වැලපෙන්නට ගත්තා.

"ලිහිණියෝ, ලිහිණියෝ, පුංචි ලිහිණියෝ'' කුමාරයා කීවා. "මම ඔබට දෙන අණ පිළිපදින්න.''

ඉතින් ලිහිණියා කුමාරයාගේ ඇසක් උගුල්ලාගෙන ශිෂ්‍යයා වාසය කළ සොල්දර කාමරය වෙත පියාසර කළා. එහි වහලයේ සිදුරක් තිබුණු නිසා ඔහු පහසුවෙන් එයින් රිංගා කාමරයට ගියා. තරුණයා තම හිස දෑතේ සඟවාගෙන සිටි නිසා ඔහුට පියාපත් හඬ ඇසුණේ නැහැ. ඔහු හිස ඔසවා බලද්දී පරවුණු වයලට් මල් පොකුර ළඟ නිල් මැණිකක් දුටුවා.

"මාව අගය කෙරෙන්න පටන් අරගෙන,'' ඔහු සතුටින් කෑගැසුවා; "මේක නාඳුනන ප්‍රශංසා කරන්නෙකුගෙන් තෑග්ගක්. දැන් මට මගේ නාට්‍යය ඉවර කරන්න පුළුවන්.'' ඔහු සිටියේ ඉතාමත් සතුටින්.

පසුදා ලිහිණියා නැව් තොට වෙත පියාසර කළා. යෝධ නැවක කුඹ ගස මුදුනේ හිඳ ඔහු නාවිකයෝ ලණු යොදාගෙන නැවෙන් විශාල පෙට්ටගම් පිටතට අදින අයුරු නැරඹුවා. පෙට්ටගමක් නැව් බඳෙන් මතුවුණු හැම වතාවකම ඔවුන් "හීව් අ.හෝයි'' කියා බෙරිහන් දුන්නා. "මම ඊජිප්තුවට යනවා'' ලිහිණියාත් කෑගැසුවා, එහෙත් කිසි කෙනෙක් එය ගණනකට ගත්තේ නැහැ. සඳ නැඟ එද්දී ඔහු නැවතත් ප්‍රීතිමත් කුමාරයා වෙත පියාසර කළා.

"මම ආවේ ඔබෙන් සමුගෙන යන්නට'' ඔහු කීවා.

"ලිහිණියෝ, ලිහිණියෝ, පුංචි ලිහිණියෝ'' කුමාරයා කීවා. "ඔබට බැරිද මාත් එක්ක තව එක රැයක් ගතකරන්න?''

"දැන් සීත කාලය,'' ලිහිණියා පිළිතුරු දුන්නා, "බොහොම ඉක්මනින් සීත හිම වැටෙන්නට පටන් ගනීවි. ඊජිප්තුවේ නම් කොළ පාට තල් ගස් උඩට ඉර අව්ව සැරට වැටිලා ඇති. කිඹුලෝ මඩේ වැතිරිලා කම්මැලිකමෙන් වටපිට බලනවා ඇති. මගේ සගයෝ ටික බාල්බෙක් පන්සලේ කැදලි තනනවා ඇති. ඔවුන් දිහා බලාගෙන රෝසපාට, සුදු පාට කොබෙයියන් එකිනෙකාට කරව් කරනවා ඇති. ආදරණීය කුමාරයෝ, මම ඔබගෙන් සමුගෙන යා යුතුයි. මට ඔබව කවදාවත් අමතක වෙන්නේ නැහැ. ඊළඟ වසන්තයේදී මම ආපිට එද්දී ඔබ දන් දුන්නු මැණික් වෙනුවට මම ඔබට මැණික් කැට ගෙනත් දෙන්නම්. මා ගෙනැවිත් දෙන රත් මැණික රතු රෝස මලකටත් වැඩියෙන් රතු පාට වේවි, නිල් මැණික මහා මුහුද තරම්ම නිල් පාට වේවි.''

"පහත චතුරශ්‍රයේ ඉන්නවා ගිනිකූරු විකුණන පුංචි කෙල්ලක්'' කුමාරයා කීවා. "ඈ අතින් ගිනිකූරු සියල්ලම කාණුවට වැටිලා, නාස්තිවෙලා. මුදල් නැතිව ගෙදර ගියෝතින් ඇගේ පියා ඇයට පහර දේවි. ඇය හඬමින් ඉන්නේ. ඇයට සපත්තුවත්, උණුසුම් මේස්වත් නැහැ, ඇයගේ පුංචි හිසට ආවරණයක් නැහැ. මගේ අනෙත් ඇසත් උගුල්ලාගෙන ගොස් ඇයට දෙන්න, එතකොට ඇයට පියාගෙන් ගුටිකන්නට වෙන එකක් නැහැ.''

"මම ඔබ එක්ක තව එක රැයක් ගතකරන්නම්,'' ලිහිණියා කීවා, "ඒත් මට නම් බැහැ ඔබේ ඇස උගුල්ලන්න. ඔබ එතකොට සම්පූර්ණයෙන්ම අන්ධ වේවි.''

"ලිහිණියෝ, ලිහිණියෝ, පුංචි ලිහිණියෝ'' කුමාරයා කීවා. "මම ඔබට දෙන අණ පිළිපදින්න.''

ඉතින් ඔහු කුමාරයාගේ අනෙත් ඇසත් උගුලුවාගෙන පහතට පියඹා ගියා. ඔහු ගිනිකූරු විකුණන දැරිය වෙත පහත් වී මැණික ඇගේ අත්ලේ රැඳෙව්වා. "හරිම ලස්සන වීදුරු කෑල්ලක්'' කෑගැසූ දැරිය සිනාසෙමින් තම නිවස බලා දුවන්නට වුණා.

ඉනික්බිති ලිහිණියා කුමාරයා වෙත නැවතත් ආවා. "ඔබ දැන් අන්ධයි,'' ඔහු කීවා "ඒනිසා මම හැමදාම ඔබ ළඟින්ම ඉන්නම්''

"එපා, පුංචි ලිහිණියෝ,'' අසරණ කුමාරයා කීවා, "ඔබ ඊජිප්තුව බලා යා යුතුමයි.''

"මම හැමදාම ඔබ ළඟින්ම ඉන්නම්'' කී ලිහිණියා කුමාරයාගේ දෙපතුල අසල නින්දට ගියා.

ඊළඟ දවස මුළුල්ලේම ඔහු කුමාරයාගේ උරහිස මත හිඳ තමන් දුරු රටවලදී දුටු අමුතු දේ ගැන විස්තර කරන්නට වුණා.

නයිල් ගඟේ ඉවුරුවල පේළි ගැසී සිටිමින් හොට අගින් රන් මසුන් අල්ලන අයිබිස් කොකුන් ගැන, කාන්තාරයේ වෙසෙන, ලෝකය තරමටම පැරණි, සියලු දේ ගැන දන්නා ස්ෆින්ක්ස් ගැන, කහ පැහැති මාල අතින් ගෙන තමන්ගේ ඔටුවන් අසලින් සෙමෙන් ගමන් ගන්නා වෙළෙඳුන් ගැන, කළුවර ලී තරමටම කළු පැහැති, විශාල පළිඟු ගෝලයකට වන්දනා කරන සඳේ කඳු වලට අධිපති රජු ගැන, තල් ගසක නිදන, පූජකයන් විසි දෙනෙකුගෙන් පැණි කැවුම් ලබන තෙදැති කොළ සර්පයා ගැන, පැතලි විශාල පත්‍ර මත නැගී වැව තරණය කරන, නිරතුරුව සමනලයන් සමඟ සටන් කරන අඟුටුමිට්ටන් ගැන විස්තර ඔහු කුමාරයාට කීවා.

"ආදරණීය පුංචි ලිහිණියෝ,'' කුමාරයා කීවා, "ඔබ මට ආශ්චර්යමත් දේ ගැන කියනවා, එහෙත් මේ ලෝකේ වඩාත්ම ආශ්චර්යවත් දේ තමයි මිනිසුන් සහ ගැහැනුන්ගේ ඇති වේදනාව දරා ගැනීමේ හැකියාව. මිනිසුන්ගේ දුක්ඛිතකම තරම් තවත් අභිරහසක් නැහැ. මගේ නගරයට ඉහළින් පියාසර කරන්න පුංචි ලිහිණියෝ, ඔබ දකින දේ මට කියන්න.''

ඉතින් ලිහිණියා විසල් නගරයට ඉහළින් පියාසර කළා. පෝසතුන් තමන්ගේ අලංකාර නිවෙස්වල සාද පවත්වද්දී හිඟන්නන් ඒවායේ ගේට්ටු අසල හිඳ සිටින අයුරු ඔහු දුටුවා. ඔහු අඳුරු මාවත් වල පියාසර කරද්දී, බඩගින්නේ පෙළෙන දරුවන්ගේ සුදුමැලි මුහුණු හිස් බැල්මෙන් අඳුර දෙස යොමු වී ඇති අයුරු දුටුවා. පාලමක ආරුක්කුවක් යට කුඩා ළමුන් දෙදෙනෙක් එකට ගුලි වී සිටියේ උණුසුම් වීමට තැත් කරමින්. "අනේ, අපිට කොයිතරම් බඩගිනිද!'' ඔවුන් කීවා. "ඔතැන නිදාගන්න බැහැ'' කියා මුරකරු කෑගැසූ විට ඔවුන් වැස්සේම යන්නට ගියා.

ඔහු ආපසු පියඹා ගොස් කුමාරයාට ඔහු දුටු දේ කීවා.

"මගේ ඇඟ පුරා තියෙන්නේ පිරිසිදු රත්තරන්,'' කුමාරයා කීවා, "ඔබ එය රන් පත්‍රයෙන් පත්‍රය ගැලවිය යුතුයි. ඒවා මගේ දුප්පතුන්ට දෙන්න. ජීවත්ව සිටින අය රත්තරනින් සතුට ලබාගන්න පුළුවන් බව නිරතුරුව විශ්වාස කරනවා.''

ලිහිණියා රන් පත්‍රයෙන් පත්‍රය ගලවද්දී ප්‍රීතිමත් කුමාරයාගෙන් අඳුරු අළු පැහැයක් දිස් වෙන්නට ගත්තා. ඔහු රන් පත්‍රයෙන් පත්‍රය දුප්පතුන්ට දෙන්නට ගත් විට පුංචි දරුවන්ගේ මුහුණු රෝස පැහැයෙන් බැබලුණා, ඔවුන් වීදි පුරා සෙල්ලම් කරන්නට ගත්තා. "අපිට දැන් පාන් තියෙනවා!'' ඔවුන් සතුටින් කෑ ගැසුවා. ඉනික්බිති හිම වැටෙන්නට ගත්තා, හිම වැටුණාට අනතුරුව තුහින පැතිරෙන්නට වුණා. මංමාවත් රිදියෙන් තැනුණු තරමට බබළමින් දිලිසෙන්නට වුණා. ගෙවල්වල

19 වන පිටට